**පුත්තලම නගර සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජූලි 26 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පුත්තලම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණනන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2016 වර්ෂයට ලැබිය යුතුව තිබූ රු.48,168 ක භාෂා දීමනාව හා අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ ස්ථිර කළ සේවකයින්ට ගෙවන ලද රු.5,560,000 ක් 2017 වර්ෂයේදි ලැබී තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල ලැබිය යුතු ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතුවේ. | මෙම වරද ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | නෙළුම්කුලම් ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමට නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.10,363,588 ක් හා ගෙවිය යුතු මුදල් රු.8,863,588 ක් වෙනුවෙන් ප්‍රතිපාදන සළසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | ගිණුම් නිවැරදි කිරීම සඳහා ජ'නල් සටහන් මගින් ණයගැති ගිණුමට ඇතුළත් කිරීමට කටයුතු කරමි. ගෙවිය යුතු මුදලින් රු.1,500,000 ක් වෙනත් ණයහිමිවල දක්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (iii) | ඉකුත් වර්ෂයේ ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම් අතර වෙනස වූ රු.31,680,218 ක් හඳුනාගැනීමකින් තොරව සමුච්චිත අරමුදලට හර කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.22,133ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම වෙනසට හේතු වූ කරුණු හඳුනාගෙන වාර්තා කිරීමට කටයුතු කරමි. |
| (iv) | කල් ඉකුත් වූ රු.12,813,361 ක විවිධ තැන්පත් ලැබිය යුතු ජංගම වත්කමක් ලෙස දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම වරද ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 03 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ශේෂවල වටිනාකම රු.46,938,516 ක් විය. | අයවිය යුතු ආදායම් කඩිනමින් අයකිරීමට කටයුතු කල යුතු වේ. | මෙය භාවිතා කරන පරිගණක මෘදුකාංගයේ දෝෂයක් බැවින් නිවැරදි කිරීම් මේ වන විට සිදු කරමින් පවතින අතර හඳුනාගත් හිඟ ආදායම් එකතු කිරීමටද කටයුතු කරමින් පවතී. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 03 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ශේෂවල වටිනාකම රු.31,489,091 ක් විය. | ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතු වටිනාකම රු.268,091,801 ක්වූ ගිණුම් විෂයයන් 09 කට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ. | අවශ්‍ය විගණන සාක්ෂි ඉදිරියේදී ඉදිරිපත් කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනත (255 වන අධිකාරය) | | | |
| | (i) 33 වගන්තිය | සභාව සතු දේපළවල අයිතිය තහවුරු කෙරෙන ලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | සභාව සතු දේපළ සම්බන්ධයෙන් අයිතිය තහවුරු කෙරෙන ලේඛන වල අඩුපාඩු නිවැරදි කර විගණනයට ඉදිරිපත් කළයුතුවේ. | අයිතිය තහවුරු කෙරෙන ලේඛනවල අඩුපාඩු පවතින බැවින් ඒවා නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| | (ii) 178 (1) හා (2) උප වගන්ති | වැය විෂයය අංක සහිතව රු.375,000ක පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණද එම වියදම් සඳහා අය ප්‍රභවයන් දක්වා නොතිබුණි. | ආදායම් ප්‍රභවයන් ලබාගෙන පරිපූරක ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මු.රෙ. 565 (3) (4) හා (5) | ඉකුත් වර්ෂවල තැන්පතු ලෙජරවල ශේෂ ඉදිරියට ගෙන ආ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර, පොදු 71 ආකෘතියෙන් පිළියෙල කර මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශනද විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| | (ii) මු.රෙ. 571 | සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 03 ක කාලයක් ඉක්මවා තිබූ රු.14,685,157 ක් වූ තැන්පත් ශේෂ සම්බන්ධයෙන් | තැන්පත් ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම තැන්පත් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරමි. |

කටයුතු කර
නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය --

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.40,213,251ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමරු.67,221,862 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේ-න්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු '000. | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 23,933 | 24,143 | 12,660 | 90,493 | 24,733 | 24,185 | 7,949 | 95,561 |
| කුලී | 28,000 | 28,000 | 27,568 | 18,007 | 55,017 | 39,048 | 36,254 | 30,896 |
| බලපත්‍ර ගාස්තු | 1,000 | 1,000 | 848 | 152 | 910 | 1,032 | 1,032 | - |
| වෙනත් ආදායම් | 28,140 | 28,140 | 10,332 | 17,809 | 91,628 | 112,592 | 76,504 | 150,438 |
| එකතුව | 81,073 | 81,283 | 51,408 | 126,461 | 172,288 | 176,857 | 124,739 | 276,895 |

❖ ස් ක ළ ආ දා යම තුල සමාලෝචිත වර්ෂයට බිල් කළ ආදායමෙන් කළ එකතු කිරීම් සහ පසුගිය වර්ෂවල හිඟ ආදායමෙන් කළ එකතු කිරීම් ඇතුළත්ව තිබේ.

**2.2.2 වරිපනම් හා බදු**

**------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බිල් කල වරිපනම් බදු මුදල රු.24,143,551 න් වර්ෂය තුලදී රැස්කරගෙන තිබුණේ රු.5,982,182 ක් පමණි. එය බිල්කළ මුදලින් සියයට 28 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභාවේ සමස්ත වරිපනම් බදු හිඟය රු.106,308,257 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වේ. | ලේඛනවල දුර්වලතා හා තනතුරුවල අඩුපාඩු නිසා මෙවැනි තත්ත්වයක් උද්ගත වී ඇත. ඉදිරියේදී මෙම තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**2.2.3 කුලී**

**------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි කඩ කුලී රු.2,577,873 ක් වූ අතර කුලී ගිවිසුම්වල 3 වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |

**2.2.4 බලපත්‍ර ගාස්තු**

**----------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වෙළඳ බලපත්‍ර ආදායම් ලේඛනය අනුව හිඟ ශේෂයක් නිරීක්ෂණය නොවූවද, හිඟ ආදායම් උප ලේඛනය අනුව හා සමීක්ෂණ වාර්තා අනුව රු.152,000 ක ශේෂයක් පැවතුණි. | අදාල හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වාර්ෂික සමීක්ෂණ වාර්තා හා බලපත්‍ර ලබාගත් ව්‍යාපාර අතර වෙනස්කම් ඇතිවිය හැකිය. |

**2.2.5 වෙනත් ආදායම්**

**-----------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හිඟ හිටි වෙනත් ආදායම් උප ලේඛනය අනුව ටෙන්ඩර් ආදායම් ලෙස රු.1,029,527 ක් උසාවි දඩ රු.729,185 ක් හා දෛනික පොල ගාස්තු ලෙස රු.9,929,300ක් වර්ෂ 03 කට වැඩි කාලයක් හිඟව පැවතුණි. | අයවිය යුතු වෙනත් ආදායම් කාලීනව අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.6 උසාවි දඩ මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.22,771,442 ක් වූ අතර, සභාවට අයත් උසාවි දඩ මුදල් හඳුනාගෙන අයකරගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට පියවර ගත යුතු වේ. | අයකර ගැනීමට කටයුතුකරමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය** ---------

**3.1 කාර්යසාධනය**

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කරුණු 15 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විට අතුරු ව්‍යවස්ථා කිසිවක් පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) ක්‍රියාකාරී සැළැස්ම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාව විසින් ඉටු කළ යුතුව තිබූ කර්තව්‍යයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් (සංවර්ධන සැලැස්ම නමින්) පිළියෙල කර තිබුණද එය 2014 පෙබරවාරි 17 දිනැති PED/RED/01/04/2014/1 අංක දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | 04 ඡේදයට අනුකූල නොවිය. | | |
| (ii) | සභාව විසින් ඉටුකළ යුතුව තිබූ රු.659,255,000 ක් වටිනා කර්තව්‍යයන් 16 ක් වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | සභාව විසින් ඉටු කළ යුතු කාර්යයන්ද ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර කාලීනව ඒවා ඉටු කිරීමට පියවර ගත යුතු වේ. | ඉදිරියේදී ප්‍රතිපාදන වෙන්කරන ආකාරයේ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**(ඈ)** **ප්‍රතිපාදන නොසැලසීම**

**-------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පිළියෙලකර තිබූ වාර්ෂික සංවර්ධන සැලැස්ම අනුව සභාව විසින් ඉටුකල යුතුව තිබූ කර්තව්‍යයන් 08 ක් සඳහා වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන නොසැලසීම නිසා එම කර්තව්‍යයන් ඉටුකල නොහැකිවී තිබුණි. | සභාව විසින් ඉටු කල යුතු කර්තව්‍යයන් සඳහා වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන සලසාගෙන එම කාර්යයන් කඩිනමින් ඉටු කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී මෙම අඩුපාඩුව සිදු නොවීමට කටයුතු කරමි. |

**(ඈ)** **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම** **----**

**------------------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සංවර්ධන සැලැස්මේ දක්වා තිබූ විවිධ කර්තව්‍යයන් 09ක් ඉටු කිරීම සඳහා රු.10,778,187 ක මුදලක් වැය කර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම් අත්පත් කරගෙන නොතිබුණි. | සංවර්ධන සැලැස්ම අනුව කාලීනව අදාල කාර්යයන් කඩිනමින් ඉටුකිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී මෙම අඩුපාඩුව සිදු නොවීමට වග බලා ගනිමි. |

**(ඉ)** **අත්හැර දැමූ කර්තව්‍යයන්**

**----------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා රු.1,675,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු නමුත් දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රතිඵල ලබා නොතිබුණු කර්තව්‍යයන් 07 ක් විය. | අයවැය ප්‍රකාරව ප්‍රතිපාදන සලසා ඇති කාර්යයන් කාලීනව කඩිනමින් ඉටු කිරීමට පියවර ගත යුතු වේ. | ඉදිරියේදී මෙම අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

**(ඊ)** **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** **-------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුත්තලම නගර සභා සීමාව තුල සතියකට කසළ ටොන් 69 ක් පමණ එකතු වන අතර, | කඩිනමින් විදුලිය ලබාගෙන කසළ | මේ වන විට විදුලි බලය ලබාගෙන ඇති |

| | | |
|---|---|---|
| ඉන් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොමු කරනුයේ ¼ක් (ටොන් 12ක්) පමණ ප්‍රමාණයකි. ඉතිරි කසළ විවෘත ස්ථානයකට බැහැර කරනු ලබයි. කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ සතියකට ටොන් 3.15ක් පමණ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරනු ලැබුවද සතියකට අලෙවි කරනුයේ පොහොර කිලෝ ග්‍රෑම් 225 ක් පමණ ප්‍රමාණයකි. තවද කොම්පෝස්ට් අංගනයට ජලය, ජල බවුසර් මගින් සම්පාදනය කරතිබුණු අතර, විදුලිය ලබාගෙන නොතිබුණි. එබැවින් හලන යන්ත්‍රය භාවිතා කිරීමට නොහැකිවී තිබුණි. | කළමනාකරණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ. | අතර ඉදිරියේදී කටයුතු සාර්ථකව කරගෙන යාමට කටයුතු කරමි. |

**(උ) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාව "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත් වී තිබුණද ඒ සම්බන්ධ පහත කරුණු නිරීක්ෂණය විය.<br>තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පහත පරිදි හඳුනාගෙන තිබුණු අතර ඒවා මැනීම සඳහා නියාමනයන් සිදුවී නොමැති හෙයින් ඒ සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සඳහා දර්ශක හඳුනාගෙන අදාල ඉලක්ක කරා ළඟාවීමට කඩිනමින් කටයුතු කළ යුතු වේ. | තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් දැනුවත් වී ඇත. පවතින අඩුපාඩු නිවැරදි කර ගනිමින් ඉදිරියට කටයුතු කරමි. |

| අරමුණු | ඉලක්කය |
|---|---|
| දිළිඳුබව අවම කිරීම | දිළිඳුකම තුරන් කිරීම |
| පාරිසරික වැඩසටහන් කිරීම | පරිසරය රැකගැනීම |
| ආබාධිත පුද්ගලයින් සවිබල ගැන්වීම | තමුන්ගේ ජීවිතයට ශක්තියක් වීම |
| ප්‍රජා සමගිය ඇති කිරීම | විවිධ ජාතින් අතර සමගිය |

ඇති කිරීම

(ii) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟාවීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් හඳුනාගෙන තිබුණද ඒ අය සඳහා දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟාවීමේදී අදාළ කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය වන සන්ධිස්ථානයන් සභාව හඳුනාගෙන නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**----------------------------------**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දින සභා ගබඩාව ගිනිගැනීම සම්බන්ධව සිදුකරන ලද පරීක්ෂණයේ ප්‍රාරම්භක වාර්තාව අනුව සිදුවී තිබූ අලාභය රු.948,000ක් වූ අතර මූලික පරීක්ෂණයක් සිදුකිරීමට 2019 පෙබරවාරි 15 දින කැඳවූ විමර්ශන මණ්ඩලය විසින් නිකුත් කළ වාර්තාවට අනුව සිදුවී තිබූ මූල්‍ය අලාභය රු.2,433,668 ක් විය. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදුකර එහි වාර්තාව හා ප්‍රාරම්භක වාර්තාව ලබාදීමට කටයුතු කර ඇත. එසේ වුවද පළාත් පාලන කොමසාරිස්තුමා විසින් මු.රෙ.104 අනුව නැවත පරීක්ෂණ මණ්ඩලයක් පත්කරන ලෙස දන්වා ඇත. ඒ අනුව නැවත පරීක්ෂණ මණ්ඩලයක් පත්කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළ ඉදිරිපත් කර තිබූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල සඳහන් නිර්දේශ සභාව ක්‍රියාත්මක කර නොතිබුණු අතර, ඉකුත් වර්ෂයේ අස්ථානගත පොත් හා භාණ්ඩ සම්බන්ධයෙන් හා ලේඛන/ඉන්වෙන්ට්‍රිගත නොවූ භාණ්ඩ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු වේ. | තනතුරුවල පුරප්පාඩු පුරවා ඇති බැවින් මේ වන විට මෙම කටයුතු සිදු කරමින් පවතී. |
| (ඇ) | වයඹ පළාත් පාලන කොමසාරිස්ගේ 10/සේ/හලා/නස හා 2002 අගෝස්තු 30 දිනැති ලිපියට අනුව දේපළ තහනම් කිරීමේ නිලධාරීන්ට ක්ෂේත්‍රයට ගොස් | ක්ෂේත්‍රයේ එකතු කිරීම් සඳහා පමණක් කොමිස් මුදල් ගෙවීමට කටයුතු කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | හිඟ මුදල් එකතු කිරීම වෙනුවෙන් සියයට 10ක කොමිස් මුදලක් ගෙවන ලෙස දන්වා තිබුණද, නගර සභාවේ හිඟ ආදායම් එකතු කිරීමේ තනතුරට කොන්ත්‍රාත් පදනම යටතේ දෙදෙනෙකු පත්කර කාර්යාලයට ගෙවන හිඟ මුදල් සඳහා සියයට 10 බැගින් කොමිස් මුදල් රු.104,000 ක් සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබුණි. | | |
| (ඈ) | 1992 මුදල් රෙගුලාසි 31 සංශෝධනය කරමින් 2015 ජූලි 04 දින නිකුත් කරන ලද රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2013 හා මු.රෙ.371(2)(ආ) අනුව කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000ක උපරිමයක් දක්වා තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබාදීමට හැකි නමුත් යථෝක්ත මුදල් වටිනාකම ඉක්මවා පෞද්ගලික ආයතන හා පුද්ගලයින් වෙත අත්තිකාරම් ගෙවා තිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. | වැරදි නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට නිරවුල් කර නොමැති රු.57,347,818 ක අත්තිකාරම් ශේෂයක් වූ අතර ඒ තුල හඳුනා නොගත් රු.18,580,150 ක් හා අවුරුදු 17 ක සිට නිරවුල් නොකළ රු.223,656ක ශේෂයක්ද විය. තවද ඉකුත් වර්ෂයේ ලබාගෙන නිරවුල් නොකළ රු.3,444,688ක්ද විය. ඒ අනුව මු.රෙ.371(5) හා 371 (6) (ආ) පරිදි අග්‍රිමය පියවීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතු වේ. | මෙම අඩුපාඩුව **2019** අවසන් ගිණුම් මගින් එය නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඊ) | ඇල්ෆා ගිණුම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී උපදේශක ගාස්තු ලෙස රු.579,500ක් හා සියයට 20ක අත්තිකාරම් ලෙස රු.2,000,000 ක් ලබාදී තිබුණද එය නිරවුල් කර නොතිබුණි. | අදාල අත්තිකාරම් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම අත්තිකාරම් වැය ශීර්ෂයෙන් වැරදීමකින් ගෙවන ලද්දක් වේ. |
| (උ) | නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 32, 33, හා 34, වගන්ති ප්‍රකාරව නගර සභා සීමාව තුල පිහිටා ඇති නිශ්චල දේපළ නගර සභාව සතු කළ යුතුය. ඒ පිළිබඳව 1920 වර්ෂයේ සිට මේ දක්වා ආණ්ඩුකාරවරයා විසින් ලබාදී ඇති ලැයිස්තුවේ නිශ්චල දේපළ 35ක් නගර සභාව හඳුනාගෙන ලබාගැනීමට කටයුතු කර තිබුණද අදාල පැවරීම් සිදුවී නොතිබුණි. | පවරා ගැනීම් කඩනම් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පුත්තලම නගර සභාව සතු මෙම නිශ්චල දේපළ පවරා ගැනීමට නිරන්තරයෙන් උත්සාහ කරමින් පවතී. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ගණකාධිකාරි තනතුර වර්ෂ කීපයක සිට පුරප්පාඩුවී පැවති අතර, ද්විතීක තනතුරු 64 කින් 33 ක් පුරප්පාඩුවී තිබුණි. තෘතිය තනතුරු තුල අනුමැතිය රහිත 54 ක් අනියම් තනතුරු වූ අතර අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා කම්කරුවන් හා සේවකයින් 65 දෙනෙකු බඳවාගෙන වැටුප් ගෙවමින් තිබුණි. | සේවක පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත තනතුරු අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් අදාල දැනුම්දීම කර ඇතත් මෙම පුරප්පාඩු සම්පූර්ණ නොවීම හේතුවෙන් මෙම තත්ත්වය උදාවී ඇත. |

**(ආ) සේවක ණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| විශ්‍රාම ගිය, ස්ථාන මාරුවී ගිය හා සේවය හැර ගිය සේවකයින් 96 දෙනෙකුගෙන් අයවිය යුතු රු.174,530 ක් වූ ණය ශේෂය වර්ෂ 03 ට වැඩි කාලයක සිට හිඟව පැවතුණි. | අදාල ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේවා සොයාගත නොහැකි බැවින් ගිණුම්වලින් ඉවත් කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ඉල්ලා ඇත. |

**(ඇ) සේවක ඇප** -

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2008, 2016 හා 2017 වර්ෂවල පිළිවලින් අයකළ සේවක ඇප මුදල් රු.38,698 ක්, රු.6,000 ක් හා රු.16,000 ක් සභාව නමින් ආයෝජනය කර නොතිබිණි. | සේවක ඇප මුදල් ආයෝජනය කිරීමට හා කාලීනව ආපසු ගෙවීමට කටයුතු කළ යුතු වේ. | පවතින තත්ත්වයට එකඟ වෙමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 3.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
---------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතුව පැවති නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් පිළිබඳ විස්තර පහත දැක්වේ. | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | සුදුසු පරිදි කටයුතු පරීක්ෂා කර බලා ඉටු කිරීමට පියවර ගනිමි. |

| වත්කමේ ස්වභාවය | වටිනාකම | නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| ------------------- | ---------- | ----------------- |
| | රු. | |
| 49-9915- ට්‍රැක්ටර් රථය | 350,000 | 2014 සිට |
| ගල්රෝල -RR99 | 600,000 | කාලය සොයාගත නොහැක |
| ලෝඩ් මාස්ටරය - HLM99 | 14,753 | කාලය සොයාගත නොහැක |
| යතුරු පැදිය - HY - 8815 | 69,950 | 2015 සිට |
| යතුරු පැදිය - 156-7580 | 50,000 | 2014 සිට |
| යතුරු පැදිය - HH - 99 | 41,500 | 2013 සිට |

### 3.5 ප්‍රසම්පාදනය
-------------

#### 3.5.1 ප්‍රසම්පාදන සැළැස්ම
-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය අනුව සභාව මඟින් ප්‍රසම්පාදන සැළැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය

### (අ) සුපිරි ඇල්ෆා වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පුත්තලම නගර මධ්‍යයේ වර්ග අඩි 71,179 ක භූමි ප්‍රමාණයක මහල් 04 කින් යුත් කඩ කාමර 200 කින් සමන්විත සුපිරි වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීම සඳහා රු.337,750,000ක වටිනාකමට ඉදිකිරීම් පුද්ගලික සමාගමක් සමග 2015 ජුනි 10 වන දින නාගරික ලේකම් විසින් ගිවිසුමකට එළඹ තිබූ අතර එම ගිවිසුම 2017 ජූලි 20 දින එම වටිනාකමින්ම නැවත අළුත් කර තිබුණි. එසේම මෙම ව්‍යාපෘතියේ උපදේශක සේවය සඳහා කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 2.8ක ප්‍රතිශතයක් ගෙවීමට උපදේශක සමාගම සමග 2014<br><br>අගෝස්තු 07 දින සභාපති විසින් ගිවිසුමකට එළඹ තිබූ අතර මෙම ගිවිසුමද 2017 ජූලි 20 දින අළුත් කර තිබුණි. | | |
| (i) 2018 ජනවාරි 07 දින වන විට අත්තිවාරම් දමා බිම් මහලේ කොන්ක්‍රීට් කණු පමණක් ඉදිකර තිබූ අතර වර්ෂයකට පෙර සිට වැඩ නතර වී තිබුණි. | අදාල ව්‍යාපෘතිය නිම කිරීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට අවශ්‍ය වේ. | මෙම ව්‍යාපෘතියෙහි ඉදිරි වැඩ කටයුතු අඩාල වී ඇති බව පිළිගනිමි. දේශීය ණය සංවර්ධන අරමුදලින් එය ලබාගෙන ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු කිරීමටත් අදාළ කඩ කාමර ටෙන්ඩර් කිරීමටත් ඉදිරියේදී කටයුතු කරමි. |
| (ii) මෙම ඉදිකිරීමේ වාස්තු විද්‍යාඥ සැලසුම් සකස් කිරීමට උපදේශක ඉංජිනේරුවරයාට 2014 ජුනි 17 දින රු.1,535,442 ක් ගෙවා තිබුණු නමුත් උපදේශක සේවා සැපයීම වෙනුවෙන් ගෙවනු ලබන ගාස්තු සැපයීම වෙනුවෙන් උපදේශක සමාගමකට ගෙවා තිබූ සියයට 2.8ක උපදේශක ගාස්තුව තුල සියයට 0.2 ක් වශයෙන් වාස්තු විද්‍යාඥ සැලසුම් සකස් කිරීමේ වියදමක් ඇතුළත් බැවින් එකම | එක් වියදමක් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම ගොඩනැගිලි ඉදිකිරීමට අදාල වූ අවශ්‍ය වන්නා වූ උපදේශන කටයුතු ඉටු කිරීමට එම නිලධාරීන්ට අපහසු බව වාචිකව අප වෙත දැනුම් දුන් අතර ඒ අනුව මෙම ගොඩනැගිල්ලේ ගොඩනැගිලි සැලසුම් සකස් කිරීම සහ අදාල උපදේශන කටයුතු ලබාගැනීම සඳහා වෙනත් ආයතනයක සහාය ලබාගැනීමට සිදු විය.<br>ඒ අනුව නිශ්චිත ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය කරමින් ආකෝ පුද්ගලික සමාගම එම ව්‍යාපෘතියේ උපදේශන ආයතනය වශයෙන් තෝරා ගන්නා ලද අතර ඒ |

| | | |
|---|---|---|
| කාර්යය වෙනුවෙන් රු. 675,500 ක් ආයතන දෙකකට ගෙවා තිබුණි. | | අනුව නව ගොඩනැගිලි සැලසුම සඳහා රු.**675,000** ක මුදලක් එම ආයතනයට ගෙවීමට සිදුවූ බව දන්වා සිටිමි. |

**(ආ) නෙඩුම්කුලම් ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම**

-----------------------------------------------

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| මෙම ව්‍යාපෘතිය සඳහා නගර සැලසුම් සහ ජල සම්පාදන අමාත්‍යාංශයෙන් රුපියල් මිලියන 12.2 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කර තිබුණි. පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කර 2018 දෙසැම්බර් 15ට පෙර වැඩ අවසන් කර ව්‍යාපෘතියේ ප්‍රගතිය නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස දැනුම් දී තිබූ නමුත් 2019 මැයි 23 දින වන විටත් වැඩ නිම කර නොතිබුණි. | අදාල ව්‍යාපෘති කඩිනමින් නිම කිරීමට කටයුතු කළ යුතු වේ. | එක් ක්ෂේත්‍ර නිලධාරිනියක් පමණක් සිටීම නිසා මෙවැනි ප්‍රමාද සිදුවී ඇත. |
| (ii) 2018 දෙසැම්බර් 28 දින බොරළු කියුබ් 522 ක් ලැබුණු බවට දක්වා 2018 දෙසැම්බර් 31 දින බොරළු කියුබ් 300කට රු.2,400 බැගින් රු.720,000ක් ගෙවා තිබුණි. 2019 ජනවාරි 10 දින භෞතික පරීක්ෂාවට අනුව වැඩ බිමට සපයා තිබූ බොරළු මිනුම් ගත හැකි ආකාරයට ගොඩවල් ගසා නොතිබූ අතර සපයා තිබුණේ රතු පස් වර්ගයකි. | අදාල ප්‍රමිතියට අයත් බොරළු ගොනුකර මිනුම් ලබාගත යුතු වේ. | බොරළු ගොනුවේ හැඩය වෙනස් වී තිබුණි. |
| (iii) නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයට යැවීමට සකස් කර තිබූ පළමු කොටස් මුදල්, ඉල්ලුම් බිල්පතට අනුව වැඩ බිම් අමු ද්‍රව්‍ය ලෙස රු. 1,885,021 ක් ඇතුලත් කර තිබුණු අතර, එහි රු.615,780 ක සිමෙන්ති මළු 622 ක් , රු.116,994 ක් වූ සිමෙන්තිගල් 3162 ක් හා රු.780,000ක් වූ 60W ධාරිතාවයක් සහිත සූර්ය බල ශක්ති විදුලි පහන් 40 කට ගෙවීම් කර තිබුණ මුත් ගබඩාවේ හෝ වැඩ බිම තුළ මෙම ද්‍රව්‍ය නොතිබුණි. | ගෙවීම් කිරීමට පෙර ගබඩාවට භාණ්ඩ/ද්‍රව්‍ය ලැබුණු බවට සහතික විය යුතු වේ. | සූර්ය බල ශක්ති, විදුලි පහන් සුදුසු තත්ත්වයෙන් නොවීම නිසා එය සිදු නොකරන ලදී. |

| | | |
|---|---|---|
| (iv) 2019 ජනවාරි 10 දින වන විට අත්තිවාරම් මට්ටම දක්වා ජලය පිරී තිබූ අතර සක්ක බැම්ම බැඳ තිබූ කොටස් වල සිමෙන්ති වැලි මිශ්‍රණය භාවිතා නොකොට ගල් පමණක් අඩුක් කර ඇති බව නිරීක්ෂණය විය. | අදාල ප්‍රමිතියට අනුව කර්මාන්තය ඉටු කරවා ගත යුතු වේ. | අවම කාලයකින්, අව පිරිවැයකින් හා හො තත්ත්වයකින් අත්තිවාර ඉදිකර ගැනීම සඳහ කළුගල් පේළියක් අතුර ඒ මත බදාම එකතු කිරී සිදුවේ. ඉන්පසු තව කළුගල් අතුරා බදාම දම ඉදිකිරීම සිදුවිය. මෙ ඉතා සාර්ථක ලෙ ශක්තිමත් ආකාරයෙ සාදා ඇත. |

**4.**

**ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| නගර සභා ආඥා පනතේ (255 වන අධිකාරය) 179 වගන්තිය ප්‍රකාරව අයවැය ලේඛනයේ අනුමත කර ඇති මුළු වියදම් ප්‍රමාණය නොඉක්මවිය යුතු වුවද රු.4,797,774ක් ඉක්මවා තිබූ අතර වැය විෂයයන් 27 ක සභා බල ප්‍රදේශයේ හා සභාවේ සුභසාධනය වෙනුවෙන් ඇති රු.12,985,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. | අයවැය ලේඛනය අනුව අනුමත කර ඇති මුළු වියදම් ප්‍රමාණය නොඉක්මවිය යුතු වේ. | අයවැය ලේඛනය මගින් වෙන්කළ මුදල් ප්‍රමාණ ඇතැම් වැය ශීර්ෂ සඳහා ප්‍රමාණවත් නොවූ අතර මෙම කටයුතු පළපුරුදු නිලධාරීන් හා වගකිව යුතු නිලධාරීන් නොමැති නිසා නිසි පාලනයකින් තොරව ක්‍රියාත්මක වී ඇත. |